# තනතුරු ඇබෑර්තු

**විශ්‍රාම වැටුප්, සේවක අර්ථ සාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් හිමිවන**
**වයඹ පළාතේ පිහිටි සමුපකාර ආයතනයක් සමඟ එක් වන්නට ඔබට ඇරයුම්**

වයඹ පළාත තුළ මුල්‍ය ක්ෂේත්‍රයේ කටයුතුවල නියැලී සිටින ද්විතිය මට්ටමේ සමුපකාර සංවිධානයක් වන, සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ, පහත සඳහන් තනතුරු සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති, වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අභ්‍යන්තර විගණක iii

**වැටුප් පරිමාණ අංකය** : TSL - iii
**වැටුප් පරිමාණය** : රු. 42,900 - 525 x 10 - 650 x 11 - 750 x 10 - 62,800
**දීමනා** : රු. 20,400/=
**වයස** : අවුරුදු 18 - 45
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :

(අ) SL (i) වැටුප් පරිමාණයේ අභ්‍යන්තර විගණක තනතුරේ වසර 05කට නොඅඩු සේවා පළපුරුද්ද, හෝ SL (ii) වැටුප් පරිමාණයේ අභ්‍යන්තර විගණක තනතුරේ වසර 12කට නොඅඩු සේවා පළපුරුද්ද,

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය පිළිබඳ විශේෂවේදී උපාධිය සහ සමුපකාර ක්ෂේත්‍රයේ මාස 09 කට නොඅඩු ඩිප්ලෝමාව සමඟ විගණන ක්ෂේත්‍රයේ වසර 06 කට නොඅඩු සේවා පළපුරුද්ද,

(ඇ) වරලත් කළමනාකරණ ගණකාධිකරණ විභාගය (CIMA) සමත්වීම හෝ වරලත් ගණකාධිකරණ ආයතනයේ අන්තර් පරීක්ෂණය සමත්වීම සමඟ විගණන ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු සේවා පළපුරුද්ද,

(ඈ) උසස් තාක්ෂණ ආයතනයකින් හෝ කාර්මික විද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය සඳහා වූ සිව් අවුරුදු ඩිප්ලෝමා සහතිකය සමඟ සමුපකාර ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රයේ විගණනක වරයෙකු වශයෙන් වසර 08 කට නොඅඩු සේවා පළපුරුද්ද

(ඉ) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු හා මුල්‍ය ඩිප්ලෝමාව සහ සමුපකාර ක්ෂේත්‍රයේ මාස 09 කට නොඅඩු ඩිප්ලෝමාවක් සමඟ සමුපකාර බැංකු ක්ෂේත්‍රයේ අභ්‍යන්තර විගණක වරයෙකු වශයෙන් වසර 05 කට නොඅඩු සේවා පළපුරුද්ද.

## කළමනාකරණ සහකාර iii

**වැටුප් පරිමාණ අංකය** : OL - iii
**වැටුප් පරිමාණය** : රු. 29,900 - 320 x 10 - 375 x 11 - 500 x 10 - 42,225
**දීමනා** : රු. 24,000/=
**වයස** : අවුරුදු 18 - 45
**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්** :

(අ) MSSL වැටුප් පරිමාණයේ ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රයේ තනතුරක වසර 05කට නොඅඩු සේවා පළපුරුද්ද හෝ

(ආ) සමුපකාර උසස් (පෙළ) සමත්වීම හෝ අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් වානිජ අංශයෙන් විශයන් දෙකකට සම්මාන සහිතව සමත්වීම හෝ

(ඇ) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු හා මුල්‍ය කටයුතු පිළිබඳ සහතිකය සමත්වීම.

## ලැබෙන වෙනත් නිත්‍ය හා අමතර ප්‍රතිලාභ

1. විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබීම, උපරිම විශ්‍රාම හිමිකම වැටුප මත 80%.
2. සේවක අර්ථසාධක අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 15% ක දායකත්වය.
3. සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දළ වැටුප මත ආයතනයෙන් 3%ක දායකත්වය.
4. වාර්ෂික නිල ඇඳුම් ලබාදීම.
5. අඩු පොලී මත දෙනු ලබන සේවක ණය පහසුකම්,
6. වාර්ෂික ලාභය මත පදනම් වූ ප්‍රසාද දීමනා. (එක් මාසික වැටුපක්)

## පොදු කොන්දේසි

අ. අයදුම්කරුවන් මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

ආ. අදාල තනතුර වසර 2ක පරිවාස කාලයකට යටත්ය.

ඇ. කළමනාකාර සහකාර තනතුරට බඳවා ගන්නා අයඳුම්කරුවන්ට යතුරුපැදියක් හා යතුරුපැදි බලපත්‍රයක් ලබා තිබීම අනිවාර්ය වේ. පිරිමි අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

ඈ. දැනට සමුපකාර සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ඉ. සියලුම අයදුම්පත් ඇගයීම් මණ්ඩලයක් මගින් නිරීක්ෂණය කරනු ලැබේ. අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ඇත. ලිඛිත විභාගයේ හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත බඳවා ගැනීම සිදු කෙරේ.

ඉ. තනතුර සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම් පත්‍රය තුළ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

(සම්පූර්ණ නම , මුලකුරු සමඟ නම , ස්ථිර ලිපිනය , ජා.හැ. අංකය , පදිංචි දිස්ත්‍රික්කය , ග්‍රාම නිලධාරී කොට්ඨාසය , උපන් දිනය , වයස , ස්ත්‍රී / පුරුෂ භාවය , විවාහක / අවිවාහක බව , අධ්‍යාපන සුදුසුකම් , වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද හා දුරකථන අංකය ඇතුළුව අදාල වෙනත් විස්තර)

වැදගත් : අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද අනිවාර්යෙන්ම අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය. 2. ලබා ඇති අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

---

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමා විසින්ම පිළියෙල කරගත් අයදුම් පත් තම ලිපිනයැති 9 x 4 ප්‍රමාණයේ මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමඟ 2024.06.18 දින ප.ව. 12.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු අතර, අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළෙවරේ අදාල තනතුරු නාමය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

2024.05.31

සභාපති,
**සීමාසහිත වයඹ සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය**
WCRB
ග්‍රාමීය බැංකු මන්දිරය, 107, දඹුල්ල පාර, කුරුණෑගල.
දුරකථන : 037-2226191 / 2 ෆැක්ස් : 037-2234153